# කෙත හා බැඳුණු පුරාණ සිරිත් - විරිත්

**ඈ**ත අතීතයේ පටන් ම ලක්වැසියන් සිය ජීවනෝපාය සකසා ගන්නා ලද්දේ කෘෂිකර්මාන්තයෙනි. ලක්දිව ආර්ය ජනාවාස බිහිවීම දක්වා දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන එකී කෘෂිකර්මාන්තය වර්තමානය වන විට විවිධ අවස්ථා පසු කරමින් නූතන තාක්ෂණික යුගයකට පරිවර්තනය වෙමින් පවතී. ලාංකික කෘෂිකර්මාන්තයේ වර්තමානය දක්වා ම පාරම්පරිකව වී ප්‍රධාන වගාව වශයෙන් පැවතේ. ලාංකික වී ගොවිතැන ඔස්සේ පවත්වාගෙන පැමිණි සාම්ප්‍රදායික හර පද්ධතිය, සමාජීය නවීකරණයත් සමග ම විවිධ විපර්යාසවලට භාජනය වෙමින් පවතී. දේශීය කෘෂි ක්ෂේත්‍රයේ දී පැරණි ගොවීන් අනුගමනය කළ සිරිත් - විරිත් ඇදහිලි විශ්වාස අභිචාර ආදිය පිළිබඳ ව විමසා බැලීම මේ ලිපියෙ හි මූලික අරමුණ වේ.

ශ්‍රී ලංකාවේ පුරාණ ගොවිතැන සම්බන්ධයෙන් විමසා බැලීමේ දී එය ගොවියාගේ ජීවනෝපාය සරු කරන එකක් පමණක් නොව වඩාත් ගෞරවාන්විත කටයුත්තක් සේ සලකා ඔවුන් නිතරම කටයුතු කළ බව පෙනේ. යල මහ කන්න දෙක ම වගා කිරීම ආරම්භ කළ දින සිට අස්වැන්න නෙළා නිවසට ගෙන යන තෙක් ම මොවුන් සෑම කර්තව්‍යයක් ම ආරම්භ කළේ ඉමහත් ගෞරව කිරීමෙන් හා භක්ති පූර්වකව ය. ඔවුහු තවත් නොයෙක් පුද සිරිත් විරිත් ද අනුගමනය කළෝ ය. පොදුවේ මෙම සිරිත් විරිත් හා අභිචාර විධිවලින් තම ගොවිතැන් කටයුතුවල අස්වැන්න වැඩි කරගැනීම, නොයෙකුත් රෝග උපද්‍රවවලින් භවභෝග ආරක්ෂා කරගැනීම සාමය සතුට හා සෞභාග්‍ය වර්ධනය කරගැනීම අපේක්ෂා කළ බව පෙනේ.

ගොවිතැනේ දී විශේෂයෙන් ම බලපෑ හේතු සාධක ඔවුන්ට පාලනය කර ගත හැකි එවා විය. සමහර සාධක ඔවුන්ට පාලනය කර ගත නො හැකි එවා විය. ඔවුහු අහසින් ලැබෙන ජලය වැව්වලට හරවා එවා පාලනය කිරීමෙන් වී ගොවිතැන කර ගෙන ගියහ. නියගය හා කුඹුරුවලට මුහුණපෑමට සිදුවන නොයෙක් උවදුරු යම් යම් අදෘශ්‍යමාන බලවේගයන් හෝ දෙවියන් කෝපවීමෙන් සිදුවන එවා බැව් ගොවීහු තරයේ විශ්වාස කළහ. නිසි කලට වැසි ලැබීම දෙවියන් විසින් සිදු කරනු ලබන්නක් බවත් දෙවියන් කෝප වූ විට වැස්ස පමා කර නියන් උවදුරු ඇති කරන බවත් ඔවුන්ගේ විශ්වාසය විය. තව ද පොළොවට අරක්ගෙන සිටින්නේ භූතයන් බවත් ඔවුන් සතුටු කිරීමෙන් අස්වනු වැඩි කර ගත හැකි බවත් ඔවුහු විශ්වාස කළහ.

මේ අනුව දෙවියන් හා භූතයන් සතුටු කිරීම සඳහා ගොවීහු පුද සිරිත් හා පුද පූජා විධි අනුගමනය කළහ. මෙම පුද සිරිත් බුදු දහම පැමිණීමට පෙර හා පසුව බිහි වූ එවා බැව් හඳුනාගෙන ඇත. මේ ආකාරයට දුරාතීතයේ සිට පැවත හා ජන ඇදහිලි හා විශ්වාස පදනම් කර තම අස්වැන්න වැඩිකර ගැනීම සඳහා නොයෙක් අභිචාර ක්‍රම අනුගමනය කෙරිණි.

ගොවිතැන් කිරීමේ දී සුබ අසුබ වශයෙන් කාලය හා දින වෙන් වෙන් වශයෙන් හඳුනා ගෙන කටයුතු කෙරිණි. කාලය ගැන සැලකීමේ දී නැකැත් අනුව ගොවිතැන් කටයුතු ආරම්භ කිරීම, අස්වැන්න නෙළීම හා පෑගීම යනාදිය ද සිදු කරන ලදී. අඟහරුවාද, සිකුරාද හා ඉරිද දිනයන් අසුබ දිනයන් ලෙස සලකන ලදි. තව ද ශෂ්‍ය සම්පත්තිය වැඩි කර ගැනීමේ දී බොහෝ අවස්ථාවල "කිරි" සම්බන්ධ කරගෙන ඇත. ගැමි සමාජයේ ඇති වන අපල උපද්‍රව සඳහා කිරි අම්මාවරුන්ට දානය දීමත් කමතට පැමිණෙන ආපදාවල දී කිරි අම්මාවරු කිහිප දෙනෙකු විසින් කැපූ ගොයම් මිටි තුනක් ගෙන එමත් සිදු කෙරිණි. කිරි හා සම්බන්ධ තවත් කටයුත්තක් නම් අස්වැන්න නෙළාගත් පසුව වෙන් කරන ලද අළුත් සහල්වලින් අක්යාලෙන් කිරි ඉතිරවීමේ මංගල්‍ය සිදු කිරීම ය. එය වර්තමානයේ බොහෝ පළාත්වල දක්නට ලැබේ. අනුරාධපුර ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ උදෙසා ද මෙම පූජාව පවත්වයි. මෙහි දී තමන්ගේ කුඹුරු ආරක්ෂා කළ දෙවියන්ට පින්දීමත් අනිත් කන්නයේ අස්වැන්න සඳහා පිහිට ලබා ගැනීමත් ඔවුන්ගේ අරමුණු වේ.

රසායනික පොහොර භාවිතය හා නව තාක්ෂණය උපයෝගී කරගනිමින් වර්තමාන ගොවීන් විසින් නිෂ්පාදනය කරනු ලබන වී අස්වැන්නට නො අඩු ප්‍රමාණයක් පාරම්පරික ගොවීන් තම ශ්‍රමය හා තමන්ගේ සම්ප්‍රදායික ගොවිතැන් ක්‍රම හා සිරිත්විරිත් අනුගමනය කරමින් ලබා ගන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. එසේ ම, වර්තමාන ගොවීන්ට පාරම්පරික ගොවීන්

මානසික තත්ත්වයෙන් හා ධන සම්පත්තිය අතින් ද ඉහළ තත්ත්වයක සිටි බව කිව හැක. වර්තමාන ගොවීන් ණය බරින් මිරිකී විවිධ මානසික පීඩනයන්ට ලක්ව ඇත. එයට නොයෙකුත් හේතු සාධක බලපා ඇති බැව් අප හොඳින් දන්නා කරුණකි. විශේෂයෙන් ම ආධාර මත යැපෙන සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටක කාර්මීකරණය වීමත් සමග ම ගොවීන් මෙම තත්ත්වයට මුහුණ දී ඇත. එබැවින් මෙම තත්ත්වයෙන් ගොවීන් මුදවා අප රටේ ශෂ්‍ය සම්පත්තිය වැඩි දියුණු කිරීමට ඔවුන් යොමු කරවීම හා අභාවයට යන කෙත හා සම්බන්ධ පැරණි සිරිත් විරිත්. කෙම් ක්‍රම යනාදිය මත ගොවිතැන යළි ඉස්මතු කිරීම අප කාගේත් යුතුකම වන අතර එමගින් ගොවියා ගොවි ව්‍යාපාරිකයෙකු බවට පතවනු දැකීම අප කාගේත් අපේක්ෂාව වන්නේ ය.

තව ද, දැන උගෙන සොබා දහමේ අසිරිමත් බව අත්විඳිමින් කරනු ලබන හෙළ ගොවිතැන ගොවියාගේ මෙන් ම පොදු ජනතාවගේත් සිත පිනවන ආශිර්වාදයකි. එමෙන් ම පාරම්පරික වී සහ අනෙකුත් භෝග වගා කරන ගොවි පිරිස් මේ රටේ තවමත් සිටීම අපගේ වාසනාවකි. දීර්ඝායුෂ හා නිරෝගී බව ලබා දෙන එවැනි පාරම්පරික භෝග වර්ග වගා කිරීමෙන් හා එවැනි නිෂ්පාදන සුලබ කිරීමෙන් අපගේ සෞඛ්‍ය තත්ත්වය වඩාත් යහපත් කර ගත හැකිය. අපගේ දේශීය සහල් සම්බන්ධයෙන් නිතර නිතර මාධ්‍ය මගින් අප දැනුවත් කරනු ලබයි. පැරණි සහල් පිස ආහාරයට ගැනීමත් දියවැඩියාව වැනි රෝගවලට ඖෂධයන් බව පෙන්වා දී ඇත. අපගේ හෙළ ගොවිතැන පණගන්වන ගොවි සංවිධාන කිහිපයක් අප රටේ ප්‍රදේශ ගණනාවක ක්‍රියාත්මක වෙයි. එවා මගින් සුපිරි වෙළෙඳසැලවලට තමන් විසින් නිෂ්පාදිත පැරණි සහල් විකිණීමට තබා ඇත. එවායේ මිල ඉහළ වුව ද ගුණාත්මක බැව් දන්නා පාරිභෝගිකයෝ එවා මිලදී ගනිති.

අපගේ හෙළ කෘෂි සංස්කෘතිය යළි පුබුදුවාලීම අප කාගේත් වගකීම වන අතර කෙත හා බැඳුණු සිරිත් විරිත් ද අභාවයට යාමට ඉඩ නොදී එවා ආරක්ෂා කර ගනිමින් අනාගත පරපුරට දයාද කිරීමට පියවර ගත යුතු ය.


**සරත් විජයගුණවර්ධන**

අලෙවි සහකාර හා ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරි (රා.අ.)
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය


## ගොවි ජනතා

"ගොවි ජනතා" සඟරාව පිළිබඳ ව ඔබ දක්වන අදහස් හා ප්‍රතිචාර අපි ඉතා අගය කොට සලකමු. එසේ ම, ඒවා ඉදිරි කලාපයන් හි පළ කිරීමට ද කටයුතු කෙරේ. එබැවින්, එවැනි ද, සංස්කාරක වෙත දන්වා එවන මෙන් පාඨක ඔබට ආරාධනා කරමු.


**සංස්කාරක**
**"ගොවි ජනතා"**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,**
**114, විජේරාම මාවත,**
**කොළඹ - 07.**
**94-11-2696981, 2696437, 2698539 - 41** දිගුව 281